# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1770/25 - 2012 අගෝස්තු මස 10 වැනි සිකුරාදා - 2012.08.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

එල්.ඩී.—බී 4/96.

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 8(ඇ) වන වගන්තිය සමඟ කියවිය යුතු 61 වන වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

වෛද්‍ය රාජිත සේනාරත්න,
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

2012 අගෝස්තු මස 06 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග දකුණු වෙරළ (ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක) ධීවර කළමනාකරන ප්‍රදේශයේ සජීවී විසිතුරු මසුන් හෝ පොකිරිස්සන් ඇල්ලීම පිළිබඳ ධීවර මෙහෙයුම් නියෝග 2012 යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. අංක 1665/18 සහ 2010.08.04 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දකුණු වෙරළ (ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක) ධීවර කළමනාකරණ ප්‍රදේශයේ සජීවී විසිතුරු මසනු හෝ පොකිරිස්සන් ඇල්ලීම පිළිබඳ ධීවර මෙහෙයුම්වල යෙදී සිටින බලපත්‍ර දරන්නන් සම්බන්ධයෙන් මෙම නියෝග අදාළ විය යුතු ය.

3. 1996 නොවැම්බර් මස 07 වැනි දින අංක 948/25 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1996 ධීවර මෙහෙයුම් නියෝග වල පටහැනිව කුමක් සඳහන් වුවද එය නොතකා බලපත්‍ර දරන්නකු වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රයක "දකුණු වෙරළ (ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කය) ධීවර කළමනාකරණ ප්‍රදේශයේ අවස්ථාවෝචිත පරිදි සජීවී විසිතුරු මසුන් හෝ පොකිරිස්සන් ඇල්ලීම සඳහා වලංගුය" යන්න පිටසන් කර ඇත්නම් මිස කිසිම බලපත්‍ර හිමියකු විසින් මෙම ධීවර කළමනාකරණ ප්‍රදේශය තුළ සජීවී විසිතුරු මසුන් හෝ පොකිරිස්සන් ඇල්ලීම නොකළ යුතු ය.

4. (අ) එම බලපත්‍රහිමියා ලියාපදිංචි සාමාජිකයකු වන අවස්ථාවකදී ධීවර කමිටුව මගින් කරනු ලබන නිර්දේශයක් ඇතිව මිස, කිසිම ධීවර මෙහෙයුම් බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අළුත් කිරීම කරනු නොලැබිය යුතුය ; සහ

(ආ) කිසිම ධීවර මෙහෙයුම් බලපත්‍රයක් වෙනත් තැනැත්තකුට පැවරීම හෝ විකිණීම නොකළ යුතු ය.

එසේවුවද, එවැනි යම් බලපත්‍ර හිමියකු ස්ථිර වශයෙන් අශක්නුතාවයකට පත්වී ඇත්නම් හෝ මියගොස් ඇති අවස්ථාවකදී, ධීවර කමිටුවේ නිර්දේශ අනුව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම බලපත්‍රහිමියාගේ පවුලේ සාමාජිකයෙකු වෙත එකී බලපත්‍රය පැවරීම සඳහා පියවර ගනු ලැබිය යුතු ය.

1A - G 16420— 2,830 (2012/08)

5. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබිය යුතු බලපත්‍ර සංඛ්‍යාව (ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක) ධීවර කළමනාකරණ සැලැස්ම සමාලෝචනය කිරීමෙන් පසු තීරණය කරනු ලැබිය හැකි ය.

6. සජීවී විසිතුරු මසුන් සහ පොකිරිස්සන් ඇල්ලීම සඳහා ධීවර මෙහෙයුම් කටයුතු වල යෙදීමට අපේක්ෂා කරනු ලබන ඕනෑම තැනැත්තෙකු විසින් වෙනම බලපත්‍ර ලබා ගත යුතු ය.

7. ධීවර මෙහෙයුම් කටයුතුවල යෙදී නොසිටින බලපත්‍ර හිමියෙකුගේ බලපත්‍රය ධීවර කමිටුව විසින් කරනු ලබන නිර්දේශයක් අනුව මිස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අලුත්කරනු නොලැබිය යුතු ය.

8. (අ) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභියෙකුට සපයනු ලබන දත්ත සටහන් පොතේ එක් එක් මෙහෙයුමේදී අල්ලන ලද ප්‍රමාණයක් ද ඇතුලුව සජීවී විසිතුරු මසුන් හෝ පොකිරිස්සන් ඇල්ලීම පිළිබඳ සටහන් තබාගත යුතු ය.

(ආ) සෑම මාසයක් අවසානයේම දත්ත සටහන් පොත තත්කාර්ය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය ලබාදුන් නිලධරයා මගින් සහතික කර ගත යුතු අතර ධීවර මෙහෙයුම් බලපත්‍රය අලුත් කිරීමට මෙම සම්පූර්ණ කරන ලද දත්ත සටහන් පොත ඉදිරිපත් කළ යුතු ය.

9. ධීවර බෝට්ටුවක සජීවි විසිතුරු මසන් හෝ පොකිරිස්සන් ඇල්ලීම සඳහා තිබිය යුතු පතුලේ එලන කරමල් දැල් පීස් සංඛ්‍යාව පහත දැක්වෙන පරිදි විය යුතු ය.

(අ) යාන්ත්‍රික නොවන පාරම්පරික බෝට්ටුවක (NTRB) තිබිය හැකි උපරිම දැල් පීස් සංඛ්‍යාව විස්සකට (20) සීමා විය යුතු ය.

(ආ) යාන්ත්‍රික පාරම්පරික බෝට්ටුවක (NTRB) හෝ පිටත සවිකරන එන්ජින් සහිත ෆයිබර් බෝට්ටුවක (OFRP) තිබිය හැකි උපරිම දැල් පීස් සංඛ්‍යාව විසිපහකට (25) සීමා විය යුතු ය.

10. කිසිම බලපත්‍ර හිමියකු විසින් දකුණු වෙරළ (මාතර සහ ගාල්ල දිස්ත්‍රික්ක) ධීවර කළමනාකරණ ප්‍රදේශය තුළ සජීවි විසිතුරු මසුන් හෝ පොකිරිස්සන් ඇල්ලීම පෙරවරු 6.00 සිට පස්වරු 6.00 දක්වා පමණක් සිදු කළ යුතු ය.

11. මෙම නියෝගවල -

"අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන් 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 2 වන වගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ.

"ධීවර කමිටුව" යන්නෙන් දකුණු වෙරළ (මාතර හා ගාල්ල දිස්ත්‍රික්ක) ධීවර කළමනාකරණ ප්‍රදේශයේ සජීවි විසිතුරු මසුන් හෝ පොකිරිස්සන් ඇල්ලීම සඳහා 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 32 වැනි වගන්තිය හා 1997 අප්‍රේල් මස 25 වැනි දින අංක 972/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත ධීවර කමිටු අදහස් වේ.

"යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් ඔහුගේ / ඇයගේ පවුලේ සාමාජිකයා" යන්නෙන්

(i) ඔහුගේ / ඇයගේ ජීවත්ව සිටින කලත්‍රයා ; හෝ

(ii) එවැනි ජීවත්ව සිටින කළත්‍රයා නොමැති අවස්ථාවකදී වයස අවුරුදු දහ අටට වැඩි වන එම තැනැත්තාගේ පුතා හෝ දුව ;

(iii) එවැනි ජීවත්ව සිටින කළත්‍රයා නොමැති අවස්ථාවකදී, එම තැනැත්තාගේ පුතා හෝ දුව, එම තැනැත්තාගේ දෙමාපියන්ගෙන් එක් අයෙකු ; හෝ

(iv) එවැනි ජීවත් සිටින කලත්‍රයකු නොමැති අවස්ථාවකදී වයස අවුරුදු දහ අටට වැඩි එම තැනැත්තාගේ පුතා හෝ දුව හෝ ජීවත්ව සිටින දෙමාපියන්ගෙන් එක් අයෙකු, ඔහුගේ සහෝදරයා හෝ සහෝදරිය.

"බලපත්‍ර දරන්නකු" යන්නෙන් සජීවි විසිතුරු මසුන් හෝ පොකිරිස්සන් ධීවර මෙහෙයුම්වල යෙදීම සඳහා බලපත්‍ර මිහි තැනැත්තෙකු අදහස් වේ.

"දකුණු වෙරළ (මාතර සහ ගාල්ල දිස්ත්‍රික්ක) ධීවර කළමනාකරණ ප්‍රදේශය" යන්නෙන් 2010 අගෝස්තු මස 4 වැනි දින අංක 1665/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් නම් කර ඇති ප්‍රදේශය අදහස් වේ.

08 - 729

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.